ආගමික උමතු අන්තවාදයත්,
ජාතිවාදයත් පරදා
ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාවත්,
ජාතික සමගියත් තහවුරු කිරීම සඳහා

# රට හමුවේ තබන විශේෂ යෝජනා මාලාව

ජනතා විමුක්ති පෙරමුණ

## ආගමික උමතු අන්තවාදයත්, ජාතිවාදයත් පරදා ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාවත්, ජාතික සමගියත් තහවුරු කිරීම සඳහා

# රට හමුවේ තබන විශේෂ යෝජනා මාලාව

පසුගිය 2019 අප්‍රේල් 21වැනි පාස්කු ඉරුදින මරාගෙන මැරෙන ඉස්ලාම් ආගමික උමතු අන්තවාදීන් පිරිසක් විසින් කතෝලික ආගමික දේවස්ථාන කිහිපයකටත් සංචාරක හෝටල් කිහිපයකටත් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාර මාලාව සමග ලංකාවේ මහජනතාවගේ ආරක්ෂාවත්, පොදු සමාජ ජීවිතයත් බරපතළ අනතුරකට හා අභියෝගයකට ලක්විය. මෙම ප්‍රහාරයත් සමග ලංකාවේ දේශපාලනයේද අභියෝග රැසක් මතුවිය.

මෙම ප්‍රහාරය ජාතික තව්හිත් ජමාත් නම් ඉස්ලාම් ආගමික උමතු අන්තවාදී සංවිධානය විසින් එල්ල කරන ලද්දක් බව තහවුරු වී තිබේ. මෙය ලංකාව තුළ සැලසුම් කළ ප්‍රහාරයක් වුවද මෙයට මැදපෙරදිග ක්‍රියාත්මක වන ISIS නම් අන්තවාදී ත්‍රස්තවාදී සංවිධානය හා සබඳතාවන් තිබූ බවද හෙළිවී තිබේ. මෙම අන්තවාදී කණ්ඩායම් ලංකාව තුළ හැදී වැඩී පෝෂණය වූයේ පසුගිය කාලයේ පැවති ආණ්ඩුවල අවබෝධය මත වන අතර ලංකාවේ ජාතිවාදය මත පදනම් වූ බලලෝභී දේශපාලනය ඊට රුකුලක් වී ඇති බව පැහැදිලිය.

අනෙක් අතට මෙම ප්‍රහාරය සඳහා මතවාදයත්, ආදර්ශය හා අධ්‍යාත්මික පෙළඹුමත් කරන ලද ISIS වැනි ත්‍රස්තවාදී අන්තවාදී සංවිධාන ලොව බිහිවූයේ අහම්බයෙන් නොව, ලොව මැදපෙරදිග කලාපයේ දේශපාලන හා ආර්ථික ආධිපත්‍යය තමන් අතට ගැනීම සඳහා එම කලාපයේ එක්සත් ජනපද ගැති නොවන ආණ්ඩු පෙරළා දැමීමට හෝ ඒවා දුබල කිරීම සඳහා එක්සත් ජනපදයේ ඍජු හා වක්‍ර මැදිහත්වීමෙන් බවද පැහැදිලිය. 1980 දශකවල සිට සමාජවාදී කඳවුර දුර්වල කිරීමටත් ඉන්පසු මැදපෙරදිග තෙල් සම්පත කොල්ලකෑම සඳහාත් බළල් අතක් ලෙස එක්සත් ජනපදය විසින් යොදාගනු ලැබුවේ මෙවැනි ත්‍රස්තවාදී අන්තවාදී සංවිධානයන්ය. එබැවින් ලොව පුරා පැතිරෙන මෙම ආගමික අන්තවාදය හා ගෝලීය ත්‍රස්තවාදය සමග එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයේ ඇති සම්බන්ධය සැඟවිය හැක්කක් නොවේ.

අනෙක් අතට මෙවැනි අන්තවාදයන් හා ත්‍රස්ත ක්‍රියා හා ජාතිවාදී ගැටුම් බිහිවීම සඳහා අපගේ රටවල පවතින ජාතිවාදී හා ආගමික අන්තවාදී මතවාදයන් හා මනෝභාවයන්ද ඉවහල් වන බව පැහැදිලිය. එක් එක් ජාතිවාදයන් හා ආගමික අන්තවාදයන් විසින් අනෙක් පාර්ශ්වයේ ජාතිවාදයත්, ආගමික අන්තවාදයත් පෝෂණය කරනු ලබන බව පැහැදිලි සත්‍යයකි. මෙම සියලු ජාතිවාදයන් හා ආගමික අන්තවාදයන් පිටුපස සිටින්නේ, ලංකාවේ ජාතිවාදය මත බලය ලබාගැනීම අරමුණු කරගෙන දේශපාලනය කරන ධනේශ්වර දේශපාලන පක්ෂ හා කණ්ඩායම් බව නොරහසකි. ඔවුන් වපුරන ජාතිවාදය හා අන්තවාදය ඔවුන්ටම විටෙක පාලනය කර ගත නොහැකි වන බවද පැහැදිලිය.

මෙම ප්‍රහාරයෙන් පසුව රට තුළ මතුව ඇති අනාරක්ෂිතභාවයත්, බියත්, සැකය හා අවිශ්වාසයත්, විශේෂයෙන් මතුව ඇති බරපතළ මුස්ලිම් විරෝධයත්, මෙම සිදුවීම දේශපාලන අරමුණු සඳහා යොදා ගැනීමේ උත්සාහයත් නිසා ජන ජීවිතය සාමාන්‍යකරණය කර ගැනීමටද, මහජන ආරක්ෂාව හා ජාතික සමගිය තහවුරු කර ගැනීමටද බාධා වී තිබේ.

එබැවින් ජාතික ආරක්ෂාවත් මහජන ආරක්ෂාවත් තහවුරු කළ යුතුය. එය කළ හැක්කේ ජාතිවාදයන් ඇවිස්සීමෙන් තව තවත් බෙදී වෙන්වී හුදකලා වීමෙන් නොව ජාතික සමගිය ඇතිකර ගැනීමෙන් පමණි. ජාතික

සමගිය නැති තැනක ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව සහතික වන්නේ නැත. එබැවින් "ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාව සඳහා ජාතික සමගිය" යන සටන් පාඨය පෙරදැරි කරගෙන හැමදෙනාම කටයුතු කළ යුතුව තිබේ.

ලංකාවේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සියලු ජන කොට්ඨාසයක්ම තම තමන්ගේ සංස්කෘතික වෙනස්කම් පවත්වාගෙන යාමේදී සෑමදෙනාගේම සංස්කෘතික විවිධත්වයට ගරු කළ යුතුය. එහෙත් එම සංස්කෘතික අනන්‍යතාවයන් ශ්‍රී ලාංකිකයන් ලෙස සමගිවීමට, එක්වීමට බාධාකරන, ඈත්වීමේ දිශාවට හා සැකය අවිශ්වාසය ගොඩනැගීමේ දිශාවට නොවිය යුතුය. සියලුම දෙනා ශ්‍රී ලාංකිකයන් ලෙස සිතීමට හැකි පරිසරයක් සහ මතවාදයක් නිර්මාණය කරගත යුතුය.

මෙම තත්වය තුළ ජාතිවාදී හා ආගමික අන්තවාදී ප්‍රහාරයන් හා ගැටුම් වැළැක්වීමටත් යළි මෙවැනි බේදවාචක නිර්මාණය නොවීමටත් රට තුළ ජාතික සමගිය ගොඩනඟා මහජන ආරක්ෂාව තහවුරු කිරීමටත් රටක් ලෙස ඉටු කළ යුතු යැයි අප විශ්වාස කරන පහත යෝජනා මෙසේ රට හමුවේ තබමු.

## පොදු ප්‍රතිසංස්කරණ යෝජනා:

1. ශ්‍රී ලංකාව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලුම ජාතිකත්වයන්ට අයත් සියලුම පුරවැසියන්ට සමාන පුරවැසි අයිතියක් සහිත ජනරජයක් බව පිළිගත යුතුය.

2. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ආගමක් ඇදහීමට මෙන්ම කැමති පුද්ගලයකුට තමා කැමැති ආගමක් ඇදහීමට ඇති අයිතිය සම්පූර්ණයෙන් පිළිගත යුතුය; ආරක්ෂා කළ යුතුය.

3. ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයන් ජාතික, ආගමික, ලිංග භේදයකින් තොරව සියලු දෙනාම සියලුම අපරාධ හා සිවිල් නීති මඟින් සමාන විය යුතුය; සමානව පාලනය විය යුතුය.

දැනට ජාතික, ආගමික හා ලිංගික වශයෙන් වෙනස්කම් ඇති සිවිල් නීති පොදු නීති යටතට ගත යුතුය. ආගමික අයිතිය පෞද්ගලික වන නමුත් නීති රාජ්‍යයට අයත් වේ. ආගමික සංස්ථාවලට අදාළව පවතින නීති හෝ සම්ප්‍රදායන් පොදු නීතිය අභියෝගයට ලක් නොකරන ඒවා විය යුතු වන අතර පොදු නීතියම සෑම විටම බලාත්මක විය යුතුය.

4. ජාති, ආගම් හා ප්‍රදේශ පදනමින් දේශපාලන පක්ෂ ආරම්භ කර පවත්වාගෙන යාම, ලියාපදිංචි කිරීම නතර කිරීමට නීති සකස් කළ යුතුය.

5. ජාතිවාදී හා ආගමික ගැටුම්වලින් පීඩාවට පත් බොහෝ රටවල ක්‍රියාවට නගා ඇති පරිදි ජනතාව තුළ ගොඩනැඟී ඇති සැකය, වෛරය හා අවිශ්වාසය දුරු කිරීම සඳහා සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිසමක් (Truth and Reconciliation Commission) වහා පිහිටු විය යුතුය.

6. ජාතික, ආගමික, කුල හෝ ලිංගිකමය වෙනස්කම් නිසා ඇති වන හිංසා හා බලපෑම් වැළැක්වීමට වෙනස්කම් වැළැක්වීමේ කොමිසමක් (Commission Against Discrimination) ස්ථාපිත කළ යුතුය. එම කොමිසම යටතේ වෙනස් ලෙස සැලකීම් ජනතාවට නිතිපතා වාර්තා කළ හැකි නිරීක්ෂණ මධ්‍යස්ථානයක් (Discrimination Monitoring Centre) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ස්ථාපිත කළ යුතු ය. එමඟින් ලැබෙන තොරතුරු මත එම තත්වයන් වැඩි ප්‍රදේශවල වෙනස්කම් පාලනය කිරීම සඳහා කළ යුතු නිර්දේශ කොමිසම මඟින් වරින්වර ආණ්ඩුවට යෝජනා කළ යුතුය.

7. වෛරී ප්‍රකාශ සිදු කිරීම හා ප්‍රචාරය කිරීම වැළැක්වීමේ, වෛරී ප්‍රකාශ පාලනය කිරීමේ (Anti Hate Speech Act) හඳුන්වා දිය යුතුය.

# මහජන ආරක්ෂාව

1. මහජන ආරක්ෂාව හා රටේ පොදු ආරක්ෂාව තහවුරු කිරීමේදී විදේශ රටවල් හෝ ආරක්ෂක සංවිධාන (NATO වැනි) සමඟ ගිවිසුම්වලට එළඹීමේදී රටේ ස්වෛරීත්වයට හා ස්වාධීනත්වයට හානිකර ඒවා අත්සන් නොකළ යුතු අතර කිසියම් ආරක්ෂක ගිවිසුමක් අත්සන් කිරීමේදී ඒවා පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමෙන් හා පාර්ලිමේන්තුවේ 2/3ක අනුමැතියෙන් තොරව සිදු නොකළ යුතුය.

2. රටේ පොදු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පද්ධතිය හා විශේෂයෙන් රටේ මූල්‍ය සේවා සඳහා වන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පද්ධතිය, රටේ බලශක්ති සේවා සඳහා වන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පද්ධතිය ආදිය පාලනය, අධීක්ෂණය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන මඟින් පමණක් සිදු කළ යුතු ය.

3. විදේශීය ත්‍රස්තවාදීන් හා විදේශීය ත්‍රස්ත සංවිධානවල කටයුතු කළ පුද්ගලයන් ලංකාවට පැමිණීම වැළැක්වීමට Foreign Fighter Act වැනි පනතක් සම්පාදනය කළ යුතුය.

4. දේශපාලන හෝ ආගමික හෝ සුභසාධනමය හෝ පෞද්ගලික පදනමින් ගොඩනඟන සංවිධාන පාර්ලිමේන්තු පනත් මඟින් සංස්ථාපනය කිරීම කලක සිට අතිශයින් ඉහළ ගොස් තිබෙන අතර, එමඟින් පාර්ලිමේන්තුවේ සංස්ථාපනය කිරීමෙන් ලැබෙන රාජ්‍ය පිළිගැනීම විසින් අන්තවාදී හා දූෂිත ක්‍රියා සඳහා යොදා ගැනීමේ බරපතළ අනතුරක් ඇති වී තිබේ. මෙලෙස සංවිධාන පාර්ලිමේන්තුවේ සංස්ථාපනය කිරීම සීමා කිරීම හා අධීක්ෂණය කිරීමට අවශ්‍ය වෙනස්කම් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල සිදු කිරීම.

5. එවැනි සංවිධාන සංස්ථාපනය කිරීමේදී ඒවා සැලකිය යුතු කාල පරාසයක් ක්‍රියාකාරී ලෙස කටයුතු කළ ඒවා විය යුතුය. එම සංවිධාන එක් ආගමකට, එක් ජාතිකත්වයකට පමණක් සේවා සපයන ඒවා නොවිය යුතු අතර ඒවායේ පාලන මණ්ඩල එක් පවුලකට හෝ ඥාති සබඳතා ඇති පවුල් කිහිපයකට හෝ සීමා නොවිය යුතුය.

6. රාජ්‍ය බුද්ධි අංශ හෝ විවිධ ආරක්ෂක අංශවලින් ආගම්වාදී, ජාතිවාදී, අන්තවාදී සංවිධාන ගොඩනැඟීම, පවත්වාගෙන යාම, ආධාර, උපකාර හා රැකවරණය ලබා දීම පිළිබඳව දැනට ඉදිරිපත් වී ඇති චෝදනා විභාග කිරීමට පූර්ණ බලැති කොමිසමක් පත් කළ යුතුය.

7. දේශපාලන හෝ වෙනත් බලපෑම් නිසා රාජ්‍ය නිලධාරීන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතිරීති රෙගුලාසිවලට පටහැණිව රටේ ආරක්ෂාවට, මහජන සාමයට හා සංහිඳියාවට බාධා වන අයුරින් කටයුතු කිරීමට බලපෑම් එල්ල වන නිශ්චිත අවස්ථාවන්හිදී ඒවා ඉටු නොකර සිටීමටත්, ඒවා ඉහළ අධිකරණයකට ලිඛිතව පැමිණිලි කිරීමට හා අවශ්‍ය අවස්ථාවන්හිදී ජනතාවට දැන්වීමටත් නිලධාරීන්ට අයිතිය ලැබෙන නීති සම්පාදනය (Whistle Blowers Act) කළ යුතුය.

# නීති ප්‍රතිසංස්කරණය

1. රටේ සියලුම පුරවැසියන්ට බලපාන පරිදි එක් පොදු නීති පද්ධතියක් ඇති කළ යුතුය. ඒ සඳහා දැනට ඇති මුස්ලිම් නීති, උඩරට නීති, සහ තේසවලාමේ නීතිය යන පෞද්ගලික නීති සංශෝධනය කර එක් පොදු විවාහ නීතියක් සියලු ජන කොටස්වලට බලාත්මක කළ යුතුය. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් මගින් සහතික කර ඇති ජාති, ආගම්, ස්ත්‍රී, පුරුෂ භේදයෙන් තොරව සියලු දෙනාම සමානය යන මූලධර්මය මත පදනම්ව සෑම සියලු නීතියක්ම සකස් වීම.

2. ළමා හා කාන්තා සමානාත්මතාවයේ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පදනමින්ද,

   i. විවාහ වීමේදී වයස පොදුවේ අවුරුදු 18ක් ලෙස සැලකීම

   ii. බහු විවාහ සඳහා ඇති නීතිමය ඉඩකඩ අහෝසි කිරීම

   iii. විවාහ දේපළ පැවරීමේදී කාන්තාවට අසමාන ලෙස සැලැකීමේ නීති අහෝසි කිරීම

iv. විවාහයේදී ජාතිය, ආගම, නම, කුලය මත කිසිදු බලපෑමක් ඇති නොකිරීම හා ඒවා සිය කැමැත්තෙන් තොරව වෙනස් කිරීමට බලපෑම් කිරීම තහනම් කිරීම

v. විවාහ ලියාපදිංචිය සහ දික්කසාද කටයුතු සිවිල් පරිපාලනය හා සාමාන්‍ය අධිකරණ පද්ධතියේ කටයුත්තක් බවට පත් කිරීම

vi. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ශ්‍රී ලංකාව තුළ සම්මත නීති හැර වෙනත් කිසිම නීතියක් ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමට හෝ බලාත්මක කිරීමට කටයුතු නොකිරීම

## ආගමික ආයතන ප්‍රතිසංස්කරණ හා පරිපාලනය

1. සියලුම ආගම් සඳහා රජය පිළිගත් ඒ ඒ ආගම්වල ප්‍රධානීන්ගෙන් හා ආගමික උගතුන්ගෙන් සමන්විත ආගමික මණ්ඩල ස්ථාපිත කළ යුතු අතර, ඒ ඒ ආගම්වලට අදාළ ආගමික ස්ථාන පරිපාලන කටයුතුවලට මෙම ආගමික හා සිවිල් නායක මණ්ඩල වෙන් වෙන්ව වගකීම

3. මෙම ආගමික මණ්ඩලවල ප්‍රධාන නියෝජිතයන්ගෙන් සමන්විත අන්තර් ආගමික ලේකම් කාර්යාලයක් හා සභාවක් රාජ්‍ය නායකයාගේ හා ආගමික කටයුතු භාර ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවීම

4. සියලුම ආගම් සඳහා එක් අමාත්‍යාංශයක් පිහිටුවීම

5. ආගමික ස්ථාන ඉදි කිරීමේදී හා විශාල මට්ටමින් පුළුල් කිරීමේදී අන්තර් ආගමික සභාවේ අනුමැතියෙන් අදාළ පළාත් පාලන ආයතනයේ හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අනුමැතියෙන් පමණක් සිදු කිරීම

6. සියලු ආගම් අතර ගොඩනැඟී ඇති අවිශ්වාසයන් හා සැකය ඉවත් කර ගැනීම වෙනුවෙන් එම ආගම්වල පූජ්‍ය පක්ෂය හා අනුගාමිකයන් එක්ව පුළුල් හා අඛණ්ඩ සංගායනාවන් ජාතිකව හා ප්‍රාදේශීයව පැවැත්වීම

7. ආගමික ආයතන නියාමනය කිරීම සඳහා දැනට ඇති පනත් නිසියාකාරව නියාමනය කළ හැකි පරිදි සංශෝධනය කිරීම

# අධ්‍යාපනය

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන, පෙර පාසල්, පාසල්, උසස් අධ්‍යාපන ආයතන සම්පූර්ණයෙන්ම ජාති, ආගම් පදනමින් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම අහෝසි කිරීම

2. සියලුම පෙර පාසල් හා පාසල්වලට දරුවන් තෝරා ගැනීමේ නීතිරීති සියලුම ජාති, ආගමික කණ්ඩායම්වල දරුවන්ටද විවෘත වන පරිදි සකස් කිරීම

3. රජයේ සියලුම පාසල්වල පොදු ජාතික විෂයමාලාවක් ඉගැන්වීම හා සියලුම පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යයන් දෙකෙන්ම අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම හා සම්පත් ලබා දීම

4. ආරම්භයක් වශයෙන් සියලුම පාසල්වල ප්‍රාථමික අංශ සියලුම ජාතික, ආගමික කණ්ඩායම්වලට අයත් මිශ්‍ර පාසල් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කිරීම

5. සියලුම පෞද්ගලික හා ජාත්‍යන්තර නමින් පවත්වාගෙන යන පාසල්වල ශ්‍රී ලංකාවේ දරුවන්ට ඉගැන්වීමේදී පොදු ජාතික විෂයමාලාව හෝ රටේ සංස්කෘතික සමාජයීය රටාවන් පිළිබඳ අවබෝධයක් ලැබෙන පරිදි විෂය මාලා සකස් කිරීම

6. සියලුම පාසල්වල ප්‍රධාන ආගම්වලට අයත් ආගමික හරයන් හා සංස්කෘතිය පිළිබඳව දරුවන්ට උගන්වන විෂයමාලා හඳුන්වා දීම

7. රටේ සියලුම පාසල් පවත්වාගෙන යාමේදී පොදු පාසල් දින දර්ශනයක් ඇති කිරීම සඳහා පියවර ගැනීම

8. පාසල් හා විෂය නිර්දේශ පෙළ පොත් සිංහල, දෙමළ, මුස්ලිම් සෑම දරුවකුටම රට පිළිබඳ ආදරයක් හා උරුමයක් ඇති වන පරිදිත්,

   රටේ ඉතිහාසය පිළිබඳ ගුණාත්මක අවබෝධයක් ලැබෙන පරිදිත්, රටේ විවිධ ජන ප්‍රජාවන්ගේ සිරිත් විරිත්, විශ්වාසයන් පිළිබඳව අවබෝධයක් ලැබෙන පරිදිත් බහුජාතික, බහුආගමික රටක ජාතික සමඟිය හා සංහිඳියාව නිර්මාණය කිරීමේ අරමුණෙන් යුතුවත්, ශාස්ත්‍රීය හා විද්‍යාත්මක පදනමක් මත සමාලෝචනය කිරීම

9. වයස අවුරුදු 18ට අඩු කිසිම දරුවකු පොදු පාසල් අධ්‍යාපනය වෙනුවට සාමාන්‍ය පොදු විෂය මාලාවන් උගන්වනු නොලබන හා ආගමික ඉගැන්වීම් පමණක් සිදු කරනු ලබන අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාමට නොහැකි වන පරිදි නීති සකස් කොට ක්‍රියාවට නැගීම. දැනට මෙලෙස පවත්වාගෙන යනු ලබන මෙවැනි ආගමික පාසැල් පිළිබඳ පූර්ණ සමාලෝචනයක් විද්වත් මණ්ඩලයක් මගින් සිදුකර එමගින් පිළිගනු ලබන පාසැල් සඳහා පොදු ජාතික විෂය මාලාවක් හඳුන්වා දීම. අමතර දහම් අධ්‍යාපනය අවැසි දරුවන්ට එය සාමාන්‍ය දහම් පාසල්වලින් ලබාදීම

10. ආගමික පූජකයන් පුහුණු කිරීම ආගමික කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හා අදාළ පළාත් පාලන ආයතනයේ අධීක්ෂණය මත පමණක් සිදු කළ හැකි පරිදි නියමිත ක්‍රියාවලියක් ආරම්භ කිරීම හා ආගමික ආයතන විසින් එකී ආගමෙහි පූජක පක්ෂය නිර්මාණය කිරීමේ අරමුණෙන් පවත්වා ගෙන යන අධ්‍යාපන ආයතන සඳහා ලැබී ඇති සහතිකය එකී අරමුණෙන් පරිබාහිර කිසිම අවස්ථාවක භාවිත කිරීමට ඇති වලංගුභාවය අහෝසි කිරීම

11. විශේෂයකින් තොරව සියලුම පාසැල්වල ජාතිය හෝ ආගම මත පදනම් නොවී සියලුම දරුවන්ට සෞන්දර්යය විෂයයන් ඉගැන්වීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම හා ඒ සඳහා ගුරුවරුන් පුහුණු කිරීම. මේ වනවිට ආගමික බලපෑම හේතුවෙන් වාරණයට ලක්ව සිටින දරුවන්ට සෞන්දර්යය විෂයයන් වන චිත්‍ර, සංගීතය, නර්තනය, සිනමාව, නාට්‍ය හා රංගකලාව වැනි විෂයයන් සඳහා යොමු කිරීම සඳහා දෙමාපියන්ට හා සමාජයට අනුබල දීම හා දිරිගැන්වීම

12. පුරවැසි අධ්‍යාපනය යන විෂයය යටතට මෙරට සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කලාකරුවන්, විද්‍යාඥයන් හා ක්‍රීඩකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම

13. වෙසක්, නත්තල, සිංහල දෙමළ අලුත් අවුරුදු, මහා සිව රාත්‍රී, රාමසාන් වැනි උත්සව කාලවල සියලු සිසු සිසුවියන්ට පොදුවේ සහභාගි විය හැකි උත්සව, සංස්කෘතික හා කලා සංදර්ශන පාසල් මට්ටමින් පැවැත්වීම

# ශ්‍රී ලාංකේය අනන්‍යතාවක් ඇති කිරීම සඳහා වන රාජ්‍ය ආයතන හා පොදු ප්‍රතිසංස්කරණ

1. රාජ්‍ය ආයතන තුළ පොදු ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු වන පරිදි කටයුතු කිරීමට වගබලා ගැනීම

2. ආණ්ඩුව හා පළාත් පාලන ආයතන මඟින් අනුමැතියකින් තොරව හා විශේෂ ආගමික අවශ්‍යතාවකින් තොරව පොදු මංමාවත් හා ස්ථානවල විවිධ ආගමික සංකේත ඉදි කිරීමට ඉඩ නොදීම

3. ජනතාවට තමන් කැමැති තැනක පදිංචි වීමට ඇති මූලික අයිතිය පිළිගත යුතුය. එහෙත්, යළි පදිංචි කිරීම් හෝ නව නිවාස ව්‍යාපෘති ගොඩනගා පදිංචිවීම්වලදී විවිධ ජාතික, ආගමික කණ්ඩායම් එකිනෙකා මිශ්‍ර වන අයුරින් (Integration) සිදු කිරීම. ඒ සඳහා යළි පදිංචි කිරීම් හා නව නිවාස ව්‍යාපෘති හා නව නේවාසික කලාප පුළුල් කිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායක පද්ධතීන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ලේකම්වරයාගේ හා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් සකස් කිරීම. සෑම පළාත් පාලන ආයතනයකම ප්‍රජා අනුකලන ඒකක (Community Intergration Unit) පිහිටුවීම ආරම්භ කිරීම. කිසිම පළාත් පාලන ප්‍රදේශයක් හෝ වීදි නාමයක් ජාතිකත්වය හෝ ආගමිකත්වය ප්‍රකට කෙරෙන නාමයන්ගෙන් තොර වීම

4. පෞද්ගලික ආයතන හා වෙළෙඳ ආයතනවල නාමපුවරු (ආගමික ස්ථාන හැර) ආගම හෝ ජාතිය ප්‍රකාශ කරන නාමයන් රහිත වීම

5. සමාජයේ එකිනෙකා අතර සැකය, අවිශ්වාසය ඇති වන හා අනන්‍යතාව අපැහැදිලි ඇඳුම් පැළඳුම් භාවිතය වෙනස් කිරීමට පියවර ගැනීම (උදාහරණ: බුර්කාව, මුහුණු ආවරණ)

6. අදාළ භාෂා ඉගැන්වීම් ස්ථානවල හැර ප්‍රසිද්ධ ස්ථාන සහ දේපළවල සංඥා පුවරු සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් පමණක් සඳහන් කිරීම

7. රාජ්‍ය භාෂා පනත කාර්යක්ෂමව සිංහල, දෙමළ භාෂාවන්ගෙන් ක්‍රියාත්මක කිරීම

8. ශ්‍රී ලංකාව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලුම ජන කොටස්වලට සමාන ලෙස අයිති බව දරු දැරියන්ට බාලවියේ සිටම ඒත්තුගැන්වීම. ශ්‍රී ලංකාවේ ඇති සිංහල, දෙමළ, මුස්ලිම් හා බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් සංස්කෘතික උරුමයන් පිළිබඳ පොදු අවබෝධයක් හා ආදරයක් දරුවන් තුළ ඇති කිරීම. ආගම විශ්ව ව්‍යාප්ත දෙයක් නමුත් රට සහ සංස්කෘතිය යනු ශ්‍රී ලාංකේය බවත් දරු දැරියන්ට ඒත්තු ගැන්වීම

9. පොදු ප්‍රවාහන රථවල, දුරකථන සමාගම්වල ප්‍රචාරක පණිවුඩ සමඟ හැකි නම්, සෑම පොදු හා පෞද්ගලික ආයතනවල දැන්වීම්වල පවා ජාතික, ආගමික සහජීවනය දිරිගන්වන හා ශ්‍රී ලංකාව කෙරෙහි ආදරය ඇති කරවන පාඨ පුළුල්ව ප්‍රදර්ශනය කිරීම

## ජනමාධ්‍ය

1. ජනමාධ්‍ය භාවිතයේදී ආගමික උත්සව හා අවස්ථා ප්‍රචාරය කිරීමේදී හැර අන් අවස්ථාවල පුද්ගලයන්ගේ ජාතිය සහ ආගම ඉස්මතු කෙරෙන වාර්තාකරණයන් නැවැත්වීමට කටයුතු කිරීම

2. විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය යොදාගෙන ජාතීන් අතර සැකය හා අවිශ්වාසය ඇති කිරීම වැළැක්වීමට වහා පියවර ගැනීම

3. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් ජනතාව අතර මිථ්‍යාවන් පැතිරවීම වැළැක්වීමට පියවර ගැනීම

4. රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා පවත්වාගෙන යාමේදී එක් ආගමකට පමණක් සීමා කරනු වෙනුවට විවිධ ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රචාරය කිරීම සඳහාද අවස්ථාව සැලසීම

5. ජාතික සමගිය හා මහජන සාමය පෝෂණය වන අයුරින් ජනමාධ්‍යකරණයේ යෙදීමට නිර්ණායක පද්ධතියක් සකස් කිරීම හා එම නිර්ණායක උල්ලංඝනය කිරීමට එරෙහිව ස්වාධීන ජනමාධ්‍ය අධිකාරියක් මඟින් කටයුතු කිරීම

6. ජනමාධ්‍යවලින් සහ සමාජ මාධ්‍යවලින් සිදු කරන ප්‍රකාශවලදී හා ප්‍රවෘත්තිවලදී ආගමික හිංසා පිළිබඳ පුවත්, අපහාස කිරීම් වෛරීසහගත ප්‍රකාශ ආදිය පිළිබඳ ප්‍රචාරය වැළැක්වීමට හා අධීක්ෂණයට ක්‍රමවේදයක් සැකැසීම

## ආගමික වියතුන් සතු විශේෂ කාර්යභාරය

1. ජනතාවගේ එදිනෙදා කටයුතුවලට හා සෘජුව ආගමික නොවන සමාජ කටයුතුවලට ආගමික ආයතන මගින් සිදු කරනු ලබන පාලනය හා අනවශ්‍ය මැදිහත් වීම් අවම කර ගැනීමට අවශ්‍ය රීති සංග්‍රහයක් විද්වතුන් විසින් සකස් කිරීම
2. මුස්ලිම් ජනතාව වෙළෙඳාම හා ආගමික කටයුතුවලට පමණක් සීමා වූ ප්‍රජාවක් බවට ක්‍රමානුකූලව පත්ව සිටිති. පොදු අන්‍ය සමාජයෙන් සාපේක්ෂව වෙන් වී සිටිති. ජන කොටස් අතර අවබෝධය වර්ධනයට අත්‍යවශ්‍ය වන බැවින් කලා කටයුතු, වෘත්තීය සමිති කටයුතු, කාන්තා සංවිධාන කටයුතු, ක්‍රීඩා හා වෙනත් පොදු සමාජ ජීවිතයේ කටයුතු සමඟ සම්බන්ධ වීමට ඔවුන් පෙළඹවීම
3. වාර්ගික හෝ ආගමික අනන්‍යතාව ප්‍රදර්ශනය කළ යුතු හා එමෙන්ම ඒවා අවම කර ගත හැකි අවස්ථා පිළිබඳව අවබෝධාත්මකව එකඟතාවන් ඇති කර ගැනීම
4. ශ්‍රී ලංකාවේ ජාතිකත්වයන් හා ආගමික ප්‍රජාවන් එකිනෙකා අතරත් අභ්‍යන්තරිකවත් භේදභින්න කරමින් පැමිණෙන ජාතික හා ජාත්‍යන්තර අන්තවාදී ප්‍රවණතා පිළිබඳ විමර්ශනයක් හා අධීක්ෂණයක් සහිතව සිට ඒවා වැළැක්වීමට ගත යුතු පියවර ගැනීම
5. අනෙකුත් ජන කොටස් අතර ජාත්‍යන්තරව ගොඩනඟා ඇති ඉස්ලාම් විරෝධී මතයේ බලපෑම් අවම කිරීම සඳහා ඉස්ලාමීය කලා හා සංස්කෘතික කටයුතු, සාහිත්‍යය ජනගත කිරීමට කටයුතු කිරීම හා රටේ පොදු කලා ක්ෂේත්‍රයට මුස්ලිම් කලාකරුවන්ගේ දායකත්වය වැඩි කිරීම

6. ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන්ට (සිංහල හා දෙමළ කාන්තාවන් සමග සසඳන විට) ඇති සාපේක්ෂ සීමාකම් සමහර බහුතර මුස්ලිම් රටවල පවා නැති බව මුස්ලිම් වියතුන්ගේද අදහස බැවින්, මුස්ලිම් කාන්තාවද රටේ අනෙක් කාන්තාවන් මෙන් පොදු සමාජ, සංස්කෘතික ජීවිතයට යොමු කිරීමට අවශ්‍ය ඉඩකඩ මුස්ලිම් සමාජය තුළින් නිර්මාණය කර දීම. (ලංකාවෙහි සංදර්භය සමඟ සමීප බහු සංස්කෘතික පසුබිමක් සහිත රටවල මුස්ලිම් ජනයාගේ අත්දැකීම් ලාංකේය මුස්ලිම් සමාජයට සන්නිවේදනය කිරීම සඳහා කටයුතු කිරීම)

## ජනතා විමුක්ති පෙරමුණ

464/20, Pannipitiya Road, Pelawatte, Battaramulla.
Tele:- +94 112786355 | +94112785612
Fax:- +94 112786050
Email:- jvpnewsroom@gmail.com
Web:- www.jvpsrilanka.com
Video:- video.jvpsrilanka.com
FB:- www.facebook.com/jvpsrilanka